ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119 (4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. - 2022 වර්ෂය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 79

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම්	ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග	වර්තමාන ප්‍රගතිය
විගණකාධිපතිවරයා විසින්ඉදිරිපත්කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම.	අදාළ අංශ එකතුකරගෙන විගණන විමසුමක් ලද වහාම පිළිතුරු සාකච්ඡාකර සකසා ඉදිරිපත්කරන ලෙස උපදෙස් දීම.	මසක් තුළ පිළිතුරු සපයා අවසන් කළ නොහැකි විමසුම් සඳහා අතුරු පිළිතුරු යොමුකර ඇත. අනෙකුත් සියළු විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත.
සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	ප්‍රාදේශීය හා දිස්ත්‍රික් විගණන කළමණාකරන කමිටුවල සාකච්ඡාකර දැනුවත් කිරීම හා මේ අනුව යම් ඇගයීමට භාජනය වන කරුණක් සඳහා ඉදිරි ඇගයීම් වලදී ලකුණු අඩුවුවහොත් එය නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමේදී ද සෘජුවම බලපාන බව පෙන්වා දීම.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහනවල ලේඛන පවතින අතර අයිතිය නොමැති රාජ්‍ය නොවන සංවිධාන මගින් ලබා දී ඇති වාහනවල අයිතිය හා අපහරනය කළ යුතුව පවතින වාහනවල අයිතිය තහවුරු කිරීම සඳහා අනුමැතිය කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලයෙන් ලැබී මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු අදාළ අමාත්‍යාංශ වෙත අයිතිය තහවුරු කෙරෙන ලිපි මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් යොමුකර ඇති බැවින් එම වාහන ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා යවා ඇත.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරංශ වාර්තා	ප්‍රාදේශීය හා දිස්ත්‍රික් විගණන කළමණාකරන කමිටුවල සාකච්ඡාකර දැනුවත් කිරීම හා මේ අනුව යම් ඇගයීමට භාජනය වන කරුණක් සඳහා ඉදිරි ඇගයීම්	සියලුම සංචිත වාහනවල 2023 හා 2024 වර්ෂයේ ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත නියමිත පරිදි ඉදිරිපත්කර ඇත.

විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.	වලදී ලකුණු අඩුවුවහොත් එය නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමේදී ද සෘජුවම බලපාන බව පෙන්වා දීම.	
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරුකර නොතිබුණි.	වාහනවල රාජ්‍ය ලාංඡන පින්තාරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසන ලෙස නිලධාරීන් දැනුවත් කිරීම.	සියළුම වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණයකර නොතිබුණි.	ප්‍රාදේශීය හා දිස්ත්‍රික් විගණන කළමණාකරන කමිටුවල සාකච්ඡාකර දැනුවත් කිරීම හා මේ අනුව යම් ඇගයීමට භාජනය වන කරුණක් සඳහා ඉදිරි ඇගයීම් වලදී ලකුණු අඩුවුවහොත් එය නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමේදී ද සෘජුවම බලපාන බව පෙන්වා දීම.	අපහරණය කිරීමට යෝජිත 51- 6961 රථය වෙන්දේසි කිරීමට තක්සේරු කමිටුවට යොමුකර ඇත. 32 – 5099 රථය අළුත් වැඩියාව කිරීමට පත්කළ කමිටුව නිර්දේශකර ඇත. ඒ අනුව කටයුතුකරමි.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	-	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීනකර පවත්වාගෙන යනු ලැබේ.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල්කර නොතිබීම.	ප්‍රාදේශීය හා දිස්ත්‍රික් විගණන කළමණාකරන කමිටුවල සාකච්ඡාකර දැනුවත් කිරීම හා මේ අනුව යම් ඇගයීමට භාජනය වන කරුණක් සඳහා ඉදිරි ඇගයීම් වලදී ලකුණු අඩුවුවහොත් එය නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමේදී ද සෘජුවම බලපාන බව පෙන්වා දීම.	මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කිරීමට කටයුතු කරමි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිග ණය ශේෂ පැවතීම.	ප්‍රාදේශීය හා දිස්ත්‍රික් විගණන කළමණාකරන කමිටුවල සාකච්ඡාකර දැනුවත් කිරීම හා මේ අනුව යම් ඇගයීමට භාජනය වන කරුණක් සඳහා ඉදිරි ඇගයීම් වලදී ලකුණු අඩුවුවහොත් එය නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමේදී ද සෘජුවම බලපාන බව පෙන්වා දීම.	ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය අයකරගෙන ඇත. වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය නීත්‍යානුකූලව කටයුතුකර කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. මියගිය නිලධාරීන්ගේ විශ්‍රාම ලිපිගොනුවල අඩුපාඩු සම්පූර්ණ කර පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට

		කටයුතුකරමි. වැඩ තහනම් හා සේවය අතහැර ගිය නිළධාරීන් කොටස් වශයෙන් ගෙවීම් කිරීමේ කටයුතු ද සිදුකරමින් පවතී.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතුකර නොතිබීම.	ප්‍රාදේශීය හා දිස්ත්‍රික් විගණන කළමණාකරන කමිටුවල සාකච්ඡාකර දැනුවත් කිරීම හා ඇගයීමට භාජනය වන කරුණක් සඳහා ඉදිරි ඇගයීම් වලදී ලකුණු අඩුවුවහොත් එය නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමේදී ද සෘජුවම බලපාන බව පෙන්වා දීම.	2024 අප්‍රේල් මස අවසන් වන විට වසර දෙක ඉක්ම වූ තැන්පතු නොමැත.
මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී දින 10 ක් ඇතුළත නිරවුල්කර නොතිබීම.	කාර්ය මණ්ඩල දැනුවත් කිරීම, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් විගණන කළමණාකරන කමිටුවල සාකච්ඡාකර දැනුවත් කිරීම හා ඇගයීමට භාජනය වන කරුණක් සඳහා ඉදිරි ඇගයීම් වලදී ලකුණු අඩුවුවහොත් එය නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමේදී ද සෘජුවම බලපාන බව පෙන්වා දීම.	වර්තමානයවන විට මසක් තුළ පියවා ගැනීම සිදු කෙරේ. දින 10 ක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කරමි.
මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	වියදම් පාලනය සඳහා අභ්‍යන්තර වක්‍රලේඛ හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් අනුගමනය කිරීමට අදාළ කටයුතු සිදුකර ඇත.	වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණය නිලධාරී ගමන් වියදම්, අනිකාල, නිවාඩු දින වැටුප් සඳහා ප්‍රමාණවත් නොවීම නිසා මෙම තත්වය ඇතිවී ඇත. වියදම් පාලනය කිරීමට උපරිම වියදම් සීමා පනවා ඇත.
මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	-	සෑම අවස්ථාවකම සම්බන්ධීකරණ කමිටු පැවැත්වීමට කටයුතු කළ හැකි වුවත් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ගේ ලබා දෙන දින අනුව පවත්වා ඇත. මේ වන විට ක්‍රියාත්මක තත්වයේ පවතී.

දිස්ත්‍රික් ලේකම් විසින් කැදවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබුණි.	-	මාසිකව පවත්වා කටයුතු කරයි.
දිස්ත්‍රික් නිවාස කමිටු මාසිකව රැස් වී නොතිබුණි.	-	දිස්ත්‍රික් නිවාස කමිටුව පැවත්වීම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලබයි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සම්බන්ධ රජයේ නිවාස කමිටුව මාසිකව පවත්වනු ලබයි.
දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටු මාසිකව රැස් වී නොතිබුණි	-	2024 වර්ෂයේ නියමිත පරිදි ක්‍රියාත්මක වේ.
ආයතනය තම විෂය පථය තිරසර අරමුණු හදුනාගෙන නොතිබුණි.	කාර්ය මණ්ඩල දැනුවත් කිරීම, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් විගණන කළමණාකරන කමිටුවල සාකච්ඡාකර දැනුවත් කිරීම හා ඇගයීමට භාජනය වන කරුණක් සඳහා ඉදිරි ඇගයීම් වලදී ලකුණු අඩුවුවහොත් එය නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමේදී ද සෘජුවම බලපාන බව පෙන්වා දීම.	තිරසර අරමුණු වලට අනුව ඉදිරි සැලසුම් සකස්කර ඇත.
හදුනාගත් තිරසර අරමුණු ඉටුකරගැනීම සඳහා ළඟාකර ගතයුතු ඉලක්ක තිරණයකර නොතිබුණි.	කාර්ය මණ්ඩල දැනුවත් කිරීම, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් විගණන කළමණාකරන කමිටුවල සාකච්ඡාකර දැනුවත් කිරීම හා ඇගයීමට භාජනය වන කරුණක් සඳහා ඉදිරි ඇගයීම් වලදී ලකුණු අඩුවුවහොත් එය නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමේදී ද සෘජුවම බලපාන බව පෙන්වා දීම.	තිරසර අරමුණු ඉලක්කකර ගනිමින් කාර්ය සාධනය හා ඉදිරි සැලසුම් සකස්කොට ඒ අනුව කටයුතු කරනු ලබයි.
හදුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම නොතිබුණි.	කාර්ය මණ්ඩල දැනුවත් කිරීම, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් විගණන කළමණාකරන කමිටුවල සාකච්ඡාකර දැනුවත් කිරීම හා ඇගයීමට භාජනය වන කරුණක් සඳහා ඉදිරි ඇගයීම් වලදී ලකුණු අඩුවුවහොත් එය නිලධාරීන්ගේ	ඉදිරි සැලසුම් සකස්කොට ඒ අනුව කටයුතු කරනු ලබයි.

	කාර්යසාධනය ඇගයීමේදී ද සෘජුවම බලපාන බව පෙන්වා දීම.	
ආයතනයේ ගිණුම් පිළිබඳ මතය යටත් මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතරක මට්ටමේ විය.	-	2022 වර්ෂයේ ආයතනයේ ගිණුම් පිළිබඳ මතය ආයතනයේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ මතය **යටත් මතයක්** වන බව පෙන්වා දෙමි. (ඇමුණුම් අංක 01)
දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් රැස්වී නොතිබුණි.	-	මේ වන විට සෑම කාර්තුවකම පවත්වා ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	කාර්ය මණ්ඩල දැනුවත් කිරීම, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් විගණන කළමණාකරන කමිටුවල සාකච්ඡාකර දැනුවත් කිරීම හා ඇගයීමට භාජනය වන කරුණක් සඳහා ඉදිරි ඇගයීම් වලදී ලකුණු අඩුවුවහොත් එය නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමේදී ද සෘජුවම බලපාන බව පෙන්වා දීම.	2024 වර්ෂයට වෙන්වන ලද ප්‍රතිපාදන ප්‍රමාණය මත 50% ට වැඩි මට්ටමට ගෙන ඒමට කටයුතු කරමි.
තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2016.11.17 දිනැති අංක SDW/3/3/16-2016 චක්‍රලේඛයේ අපදෙස් පරිදි වන අලි හානි හා වෙනත් වන සතුන්ගෙන් සිදුවන හානි පිළිබඳ වන්දි කමිටුව රැස් වී නොතිබුණි.	-	මේ සම්බන්ධයෙන් වන හානි ඉතාම අවම මට්මක පැවතීම හේතුවෙන් එසේ වන්දි ගෙවීම් කටයුතු නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ සිදු නොවන බැවින් එම කමිටුව පැවැත්වීමක් සිදු නොකරන අතර එවැනි සිදුවීම් දිගින් දිගටම වාර්තා වන්නේ නම් ඊට අදාළ කමිටු පවත්වා කඩිනමින් කටයුතු කිරීම සිදුකරමි.

ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
නුවරඑළිය.

ජී. ඒ. ඩී. දමයන්ති
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය.

දිස්ත්‍රික් ලේකම් ,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
නුවරඑළිය.

ඩී.එම්.පී.කේ. සත්දන
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය.

ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් සෞඛ්‍යමය අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CPCG/NE/A/KCH/2023/08

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 26 දින

ගණන්දීමේ නිලධාරී
නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 24 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.